www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ බලධාරීහු ශිෂ්‍ය කන්ඩායම යාපනය සරසවියට ඇතුල්වීමෙන් වලක්වති

**Sri Lankan authorities ban student group from Jaffna campus**

**සුභාෂ් සෝමචන්ද්‍රන් විසිනි**
**2010 ජුනි 29**

ශ්‍රී ලංකාවේ උතුරේ යාපනය විශ්ව විද්‍යාලයේ බලධාරීහු ජුනි 12 දා අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බලමන්ඩලයේ (අවිශිබම) ශිෂ්‍ය නායකයන් කන්ඩායමක් විශ්ව විද්‍යාලයට ඇතුලුවීම වලක්වාලූහ. අවිශිබමය ක්ෂනික ඉලක්කය බවට පත්වූ අතර මෙම තහනමේ පුලුල් එල්ලය වන්නේ විශ්ව විද්‍යාලය තුල කෙරෙන සියලු දේශපාලන ක්‍රියාකාරකම් මැඩීම යි.

අවිශිබමයේ සංචාරය ගැන දැනගත් විශ්ව විද්‍යාලයේ උපකුලපති එන්. ෂන්මුගලින්ගන් ඔවුන්ව හමුවීමෙන් වලකින ලෙස විශ්ව විද්‍යාල ශිෂ්‍ය සංගමයට දැනුම්දුන් අතර විශ්ව විද්‍යාල පරිශ්‍රයට ඔවුන්ට ඇතුල්වීමට අවසර දීම ප්‍රතික්ෂේප කලේ ය. විශ්ව විද්‍යාලය තුල ආතති සහගත තත්වයක් නිර්මානය කරමින් විශාල පොලිස් කන්ඩායමක් මුදාහරින ලදී. මිලිටරි රහස් ඔත්තු නිලධාරීන් විශ්ව විද්‍යාලය අවට සැරිසැරූ බව සිසුහු කීහ.

ඉහලින් එන නියෝග අනුව තමා ක්‍රියා කරන බව මාධ්‍යයට පැවසූ ෂන්මුගලින්ගන් ඒ පිලිබඳ වැඩිවිස්තර කීවේ නැත. "අපගේ ශිෂ්‍යයන් සමග දේශපාලනයේ නිරතවීමට (කිසිදු කන්ඩායමකට) ඉඩදීමට අපට නො හැක" යයි කියමින් පසුව ඔහු ප්‍රකාශයක් නිකුත් කලේ ය.

අවිශිබම කන්ඩායම නවාතැන් ගෙන සිටි හෝටලයට පැමිනි නාඳුනන කන්ඩායමක් ඔවුන්ට වහාම යාපනයෙන් පිට වන ලෙස කීහ. ආන්ඩුවට හිතවත් කොලඹ මාධ්‍ය යාපන සරසවි සිසුන් කන්ඩායමක් අවිශිබමය සමග ගැටී ඇති බව කියා සිටිය හ. *ලෝක සමාජවාදී වෙබ් අඩවිය (ලෝසවෙඅ)* සමග කථාකල සිසුහු එම චෝදනාව ප්‍රතික්ෂේප කල අතර මිලිටරිය හෝ එහි සහචර පැරාමිලිටරි කන්ඩායම් සම්බන්ධ වී ඇතැයි තමන් සැකකරන බව කීහ.

දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) පරාජයට පත් වී වසරකටත් වැඩි කාලයක් ගත වී ඇතත් යාපනය තවදුරටත් පවතින්නේ ශ්‍රී ලාංකික ආරක්ෂක හමුදාවන්ගේ දැඩි ග්‍රහනය යටතේ ය. කොලඹ ආන්ඩුවේ සහාග හවුල්කරුවකු වන ඊලම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය (ඊපීඩීපී) සමග සම්බන්ධ කන්ඩායම් වැනි පැරාමිලිටරි කන්ඩායම් සමග මිලිටරිය සමීප සහයෝගයෙන් වැඩකරයි.

අවිශිබමයේ දේශපාලනයට අශමනීය ලෙස විරුද්ධ වන අතර ම සමාජවාදී සමානතා පක්ෂය (සසප) සහ සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) යාපනය විශ්ව විද්‍යාලයෙන් පැනවූ තහනම ශිෂ්‍යයන්ගේ මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් මත එල්ල වූ ප්‍රහාරයක් ලෙස හෙලා දකිති.

අවිශිබමය යනු එල්ටීටීඊයට එරෙහි ආන්ඩුවේ වාර්ගික යුද්ධයට සම්පූර්න සහයෝගය ලබාදුන් සහ මිලිටරියේ සියලු අපරාධ ආරක්ෂා කල සිංහල ස්වෝත්තමවාදී ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) ශිෂ්‍ය අංශය යි. ගැටුමේ අවසන් මාස කිහිපය තුල එල්ටීටීඊ පාලනය යටතේ පැවැති ප්‍රදේශ මත එල්ල කල මිලිටරි ප්‍රහාරවලින් දහස් ගනන් දෙමල සිවිල් වැසියන් ඝාතනය කරන ලදී.

ජවිපෙ මෙන් ම ඉඳහිට සමාජවාදීන් ලෙස මවාපාන අවිශිබමයේ දේශපාලනය ද ගැඹුරින් ම ජාතිකවාදය සහ ප්‍රජාගනවාදය තුල ගිලී තිබේ. කොලඹ සහ රටේ අනෙක් ප්‍රදේශවල පොලිස් මැදිහත් වීම් සහ ප්‍රජාතන්ත්‍ර-විරෝධී පියවරයන්ට ආවරනය සපයා ඇති දේශපාලන විරුද්ධවාදීන්ට එරෙහි ප්‍රචන්ඩත්වයන් පිලිබඳව අවිශිබමය කුප්‍රකට ය.

තම දේශපාලනය සඟවා තබාගැනීම සඳහා අවිශිබම කන්ඩායම යාපනය විශ්ව විද්‍යාල මන්ඩපයට ගියේ මානවීය මැදිහත්වීමක - එනම් යුද්ධයේ දී සිය ශරීරාංග අහිමි වූ ශිෂ්‍යයන්ට රෝදපුටු හා අනෙකුත් උපකරන ප්‍රදානය කිරීමේ - කඩතුරාවට මුවාවී ගෙන ය. " ශ්‍රී ලංකාවේ සිංහල සහ දෙමල මිනිසුන් අතර ජනවාර්ගික ප්‍රශ්නයක් නැහැ. ජනවාර්ගික ගැටලු නිර්මානය කර ඇත්තේ දේශපාලනඥයන් විසින්. ඔවුන් සිය පැවැත්ම සඳහා එයට තෙල් දමනවා," යයි අවිශිබම නායක උදුල් ප්‍රේමරත්න යාපනයේ මාධ්‍ය ට ප්‍රකාශ කලේය.

එහෙත් ජීවිත හා ශරීරාංග අහිමි කිරීමට හේතු වූ යුද්ධයට අවිශිබමය සහ ජවිපෙ සහාය දුන්නේ ය යන සත්‍යය සැඟවිය නො හැක. 2005 දී ජනාධිපති

මහින්ද රාජපක්ෂගේ තේරී පත්වීමට සහාය දුන් ජවිපෙ 2002 සටන් විරාම ගිවිසුම නො තකා හැරීමටත් යුද්ධය නැවත ආරම්භ කිරීමටත් ඔහුට පීඩනය යෙදී ය. යුද්ධයට පාරකැපූ ඊනියා "ජනවාර්ගික ගැටලු" යනු ජවිපෙ සහයෝගය දුන් සහ තවමත් සහයෝගය දෙන දශක ගනනාවක් ඈතට දිවෙන දෙමල විරෝධී වාර්ගික වෙනස්කම් කිරීම්වල නිෂ්පාදනය යි.

විශ්ව විද්‍යාල බලධාරීන්ගේ සහ "ඉහල තැනැත්තන්ගේ" සැබෑ කාංසාව වන්නේ අවිශිබමය නොව යාපනයේ සහ ශ්‍රී ලංකාවේ අනෙක් ප්‍රදේශවල ශිෂ්‍යයන්ගේ පුලුල් දේශපාලනීකරනය යි. අවිශිබම ප්‍රචන්ඩත්වය ආවරනය ලෙස යොදාගෙන පිකට් කිරීම, පෙලපාලි පැවැත්වීම සහ විශ්ව විද්‍යාල භූමි අල්ලාගැනීම යන දීර්ඝකාලීන ශිෂ්‍ය විරෝධතා විධික්‍රම නීති විරෝධී කරන නීති පුනර්ජීවනය කිරීමට මාර්තු මාසයේදී රාජපක්ෂ ආන්ඩුව කටයුතු කලේ ය. දේශපාලන රැස්වීම් සහ "බලහත්කාරය" අඩංගු වන පත්‍රිකා බෙදීම් තහනම් කිරීමට ද එම නීති මගින් යාන්ත්‍රනයක් සම්පාදනය කරන ලදී.

මෙම ප්‍රජාතන්ත්‍ර-විරෝධී පියවරයන් යලි හඳුන්වා දෙනු ලබන්නේ ආන්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කප්පාදු පිලිවෙත් පැටවීමට සූදානම් වන තතු යටතේ ය. අප්‍රේල් මාසයේ පාර්ලිමේන්තු මැතිවරනය ජයග්‍රහනය කිරීමෙන් පසුව තව තවත් පෞද්ගලික විශ්ව විද්‍යාල ස්ථාපනය කිරීම බලාත්මක කිරීම සඳහා රාජපක්ෂ උසස් අධ්‍යාපන ඇමති එස්. බී. දිසානායකට කොල එලිය දැක්වීය. මෙම මාසය මුල දී නිකුත් කල අයවැය ඇස්තමේන්තුවලට අනුව ආන්ඩුව මහජන අධ්‍යාපනය වැඩිදුර කප්පාදු සඳහා ඉලක්ක කරගෙන ඇත.

යුද්ධ කාලසීමාවේ දී ආරක්ෂක හමුදාවල හස්තයන් තුල යාපනයේ විශ්ව විද්‍යාල සිසුහු අනවරත මර්දනයට මුහුන දුන්හ. 2006 වර්ෂයේ මැදභාගයේ දී රාජපක්ෂ යලි යුද්ධය කරා රට ඇදගෙන ගිය පසු ආන්ඩු හිතවාදී ඝාතක කල්ලි මගින් ඝාතනය කරන ලද හෝ "අතුරුදහන්" කිරීම්වලට ලක්වූ සිය ගනනක් මිනිසුන් අතරට සිසුන් ද අයත් විය.

බොහෝ ශිෂ්‍යයෝ සටනේ දී අල්ලා ගනු ලැබූ එල්ටීටීඊය මගින් පාලනය කරන ලද වන්නි ප්‍රදේශයේ සිවිල් ජනගහනයේ කොටසකි. එල්ටීටීඊයේ පරාජයෙන් පසුව 250,000කට අධික සිවිල් වැසියන් පිරිසක් සමග ඔවුන්ව මිලිටරිය මගින් නඩත්තු කරන වධ කඳවුරු වෙත් ගාල් කරනු ලැබීය. එතැන් පටන් සමහරුන් "යලි පදිංචි" කරනු ලැබ ඇතත් එක් ශිෂ්‍යයෙක් ලෝසවෙඅ වෙත මෙසේ අදහස් දැක්වී යː "අපට නිවැරදි තොරතුරු නැහැ. බොහෝ ශිෂ්‍යයන් අනෙකුත් රැඳවියන් සමග කඳවුරු තුල සිටිය හැකි යි, එහෙම නැත්නම් 'එල්ටීටීඊ සැකකරුවන්' ලෙස වෙනත් කඳවුරු වෙත ගෙනගොස් ඇති."

ඔහු මෙසේ ද කීවේ යː "යුද්ධයෙන් පස්සෙ ආරක්ෂක හමුදාත් ආන්ඩු හිතවාදී කන්ඩායමුත් අපගේ ඔත්තු බැලීම සඳහා ඔවුන්ගේ නියෝජිතයන් සිසුන් ලෙස එවුවා. අපි ඒක දැනගෙන හිටියා. ආන්ඩුවේ හෝ එහි උපකාරකයන්ගේ දේශපාලනයට වෙනස් දේශපාලනයක ශිෂ්‍යයන් හෝ දේශකයන් හෝ යෙදී ඇත්දැයි සොයාගැනීමට ඔවුන් උත්සාහ කරනවා. මෙය මර්දනය දිගටම පවත්වාගෙන යාමක්. මේක සිද්ධ වෙන්නෙ ආන්ඩු හිතවාදීන් නිදහසේ ක්‍රියාත්මක වෙද්දී."

යාපනය දිගට ම මිලිටරි ග්‍රහනයේ තබාගැනීම මෙන් ම ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් මර්දනය සහ අධ්‍යාපන පහසුකම් හා රැකියා නොමැති කම නිසා සිසුන් අතර පුලුල්ව පැතිරුනු අසහනයක් පවතී. බොහෝ දෙනා එල්ටීටීඊය සහ අනෙකුත් පක්ෂ පිලිබඳව ද විවේචනශීලී වෙති. "දෙමල දේශපාලන පක්ෂ ඔක්කොම වෙනසකින් තොරව එක්කෝ කොලඹ ආන්ඩුවට සහයෝගය දෙනවා නැත්නම් එහි සහයෝගය අපේක්ෂා කරනවා. අපි ඔවුන්ව විශ්වාස කරන්නේ නැහැ" යයි එක් ශිෂ්‍යයෙක් කීවේ ය.

තවත් ශිෂ්‍යයෙක් මෙසේ විස්තර කලේ යː "විශ්ව විද්‍යාලය තුල ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් නැහැ. අපේ අයිතිවාසිකම් හෝ ප්‍රජාතාන්ත්‍රික කාරනා ගැන සාකච්ඡා කරන්න රැස්වීමක් තියන්න අප බලධාරීන්ගේ අවසරය ගන්න ඕනි. අප අවසර ඉල්ලුවත් ඒක ප්‍රතික්ෂේප කරනවා. කලින් අප සටන්කාමී ක්‍රියාවල නිරත වුනා. මේ විදිහට අප ඕගොල්ලන්ට කතාකරනව කියල කලමනාකරනය දැනගත්තොත් අපව ක්ෂනිකව දඩයම් කරාවි. අපට ගොඩාක් ගැටලු තියෙනව. අප කිහිප වතාවක් මේ ගැන උපකුලපතිගේ අවධානය යොමුකලත් මෙතෙක් කල් කිසිවක් සිදුවෙලා නැහැ."

තවත් ශිෂ්‍යයෙක්ː "2006 අප ජීවත්වුනේ දැඩි මර්දනයක් යටතෙ. පැරාමිලිටරි කන්ඩායම් අපේ සහෝදර ශිෂ්‍යයන්ට මරන තර්ජන එල්ල කරමින් නම් ප්‍රසිද්ධ කලා. එම සිසුන් අත්අඩංගුවට පත්වුනා. බොහෝ අය අතුරුදහන්වෙලා. මුලතිවුවල අපේ මිනිසුන් ඝාතනයට ලක්වුනා. පරිපාලනය විසින් අවිශිබමය මෙහි ඒම වලක්වනු ලැබීමට අප ඇත්ත වසයෙන් ම විරුද්ධයි. එහෙත් අවිශිබමය අපව කවදාවත් ආරක්ෂා කර නැහැ. ඒ වෙනුවට එම සංවිධානය නිහඬව යුද්ධෙට සහයෝගය දුන්නා. ඔවුන් ප්‍රජාගනවාදී යි. ඔවුන්ගේ නිහඬතාවට ප්‍රධාන හේතුව ඒකයි."

© www.wsws.org